**කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 09 - 2024**

---

**1. විගණන මතය**

**1.1** කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 09 ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 09 කට අදාළව නිකුත් කර තිබුණු විගණන වාර්තා 09 න් කාරක සභා 02 ක මතය ව්‍යාවනය කිරීමද, කාරක සභා 07 ක් සඳහා තත්ත්වාගණනය කළ මතයක්ද ප්‍රකාශ කර ඇති අතර මතය ව්‍යාවනය කිරීම හා තත්ත්වාගණනය කළ මතය සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොලොන්නාව ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සියල්ල මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර අදාළ කරගත් ගිණුම්කරණ සංකල්ප කීපයක් පමණක් අනාවරණය කර තිබුණි. | ලබා දී ඇති උපදෙස් අනුව ඉදිරියට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පදනම් කරගත් සියලුම ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි අංක 118 සිට 125 දක්වා වූ වගන්ති ප්‍රකාරව ගොවිජන සේවා කාරක සභා 04 ක් විසින් ශුද්ධ වත්කම්/ස්කන්ධයේ වෙනස් වීමේ ප්‍රකාශය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | ලබා දී ඇති උපදෙස් අනුව ඉදිරියට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කළ යුතුය. |

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හෝමාගම ගොවිජන සේවා කාරක සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට තොග සත්‍යාපන වාර්තාව අනුව විවිධ තොගවල එකතු වටිනාකම රු.1,346,684 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම තොගයෙහි වටිනාකම රු.2,193,118 ක් ලෙස සඳහන් කර තිබීමෙන් වර්ෂය අවසානයට තොග වටිනාකම රු.846,434 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ප්‍රමාණාත්මක තොග ගිණුම් ශේෂ වල පෙර සිටම පැවත එන භෞතිකව නොමැති තොග ශේෂයන්ද ඇතුලත්ව ඇති අතර විධිමත් අනුමැතියකට යටත්ව කපා හැර නොමැති බව. | නිවැරදි තොග වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු අතර අදාළ ගැලපීම් සිදුකළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 04ක වසර ගණනාවක සිට කල් ඉකුත් වූ රු.1,095,935ක විවිධ තොග ශේෂය විධිමත් අනුමැතියක් ලබාගෙන පොත්වලින් කපාහැරීමකින් තොරව 2024 දෙසැම්බර් 31 දිනට ද තොග ශේෂයේ ඇතුළත් කර තිබුණි. | පිළිගනිමි.<br>කපා හැරීම් සඳහා මේ වන තෙක් අනුමැතිය ලැබී නොමැති බව. | විධිමත් අනුමැතියක් යටතේ ගැලපීම් කර නිවැරදි තොග ශේෂය මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 05ක් විසින් 2023 වර්ෂයේ වැයකළ රු.270,000 ක මුදලක් මෘදුකාංග හා ඊට අදාළ උපකරණ යටතේ ගිණුම් ගතකර තිබුණ ද, 2025 ජුනි මාසය වන විටත් උපකරණ කාරක සභා වෙත ලැබී නොතිබුණි. තවද හෝමාගම හා පාදුක්ක කාරක සභා විසින් ගිණුම් මෘදුකාංග හා උපකරණ වෙනුවෙන් ගෙවන ලද රු.108,000ක මුදල අත්තිකාරම් ගිණුමකට හර කිරීමකින් තොරව 2023 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | පිළිගනිමි. අදාළ නිවැරදි කිරීම් සිදු කරන බව. | අවශ්‍ය ගැලපීම් සිදු කර ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ඈ) | හෝමාගම ගොවිජන සේවා කාරක සභාව ප්‍රතිසංස්කරණය වෙනුවෙන් 2024 ඔක්තෝබර් මස කොන්ත්‍රාත් සමාගමට ගෙවූ රු.2,440,745ක අත්තිකාරම් මුදල ගොඩනැගිලි ගිණුමට ප්‍රාග්ධනිත කර තිබුණි. | ප්‍රාග්ධන වියදමක් නිසා ලද උපදෙස් මත ගොඩනැගිලි ගිණුමට ප්‍රාග්ධනිත කරන ලද බව. | අදාළ ඉදිකිරීම් කටයුතු අවසන් වීමෙන් පසුව පමණක් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 04ක හා ගොවිජන බැංකු 05ක 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ රු.61,000ක වියදම ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම් ගත කර නොතිබුණු අතර කාරක සභා 05ක හා | පිළිගනිමි.<br>නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වියදම් නියමිත ගිණුම් වර්ෂයට අදාළව ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගොවිජන බැංකු 04ක 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම වෙනුවෙන් ගෙවූ රු.61,000ක් 2024 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | | |
| (ඊ) | ගොඩගම බෝපේ මාර්ගය පුළුල් කිරීම හේතුවෙන් හෝමාගම ගොවිජන සේවා කාරක සභාවට සිදුවූ හානියට අදාලව 2020 වර්ෂයේදී ලැබුණු රු.3,917,967ක වන්දි මුදල ජංගම වගකීම් ලෙස දක්වා තිබුණු අතර එම මුදල් ලැබී වසර 05ක් ඉක්ම වී ඇතත් එකී මුදල විධිමත් අනුමැතිය යටතේ ආයෝජනයක යෙදවීමට හෝ වන්දි මුදල ලබාදුන් කාරණය වෙනුවෙන් යෙදවීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වන්දි මුදල් ලබාදුන් කාර්යයට හෝ විධිමත් අනුමැතිය යටතේ ඵලදායී ආයෝජනයක යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (උ) | කෝට්ටේ ගොවිජන බැංකුවේ සමාලෝචිත වර්ෂයේ තැන්පතු ගෙවීම් රු.65,896ක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වියදමක් ලෙස දක්වා තිබුණු අතර තැන්පතු සඳහා පොලී ගෙවීම් රු.74,363ක් වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව වියදම් හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු අතර අදාළ නිවැරදි කිරීම් ගිණුම්වල ගැලපිය යුතුය. |
| (ඌ) | කැස්බෑව ගොවිජන සේවා කාරක සභාව පවත්වා ගෙන යනු ලබන අක්කර 01ක් හා පර්.33ක ඉඩම කැස්බෑව ප්‍රාදේශීය ලේකම් විසින් 2024 පෙබරවාරි 12 දින පැවරීම සිදු කළ ද, අදාළ ඉඩමේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී ඉඩමේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි ඉඩමේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | පාදුක්ක හා හෝමාගම ගොවිජන බැංකු දෙකෙහි මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් ශේෂ පිළිවෙලින් රු.3,536,976ක් හා රු.1,498,596ක් වුවද, පොදු ලෙජරය තුල සමුච්චිත අරමුදල් ගිණුම් නඩත්තු කර නොතිබුණි. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේ සිට නිවැරදිව සමුච්චිත අරමුදල් ගිණුම් නඩත්තු කරන බව. | සියලු ගණුදෙනුවලට අදාලව ගිණුම් නඩත්තු කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.3.3 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 04ක ගිණුම් විෂයන් 07කට අදාළව මූල්‍ය ප්‍රකාශන හා අනුරූපී වාර්තා අතර ශේෂයන් හි එකතුව රු.672,498ක නොසැසඳුණු වෙනසක් පැවතුණි. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කරන බව. | විධිමත් පරිදි සැසැඳීම් සිදු කර ගිණුම් හෝ අනුරූපී වාර්තා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගොවිජන බැංකු 05ක ගිණුම් විෂයන් 07කට අදාළව මූල්‍ය ප්‍රකාශන හා අනුරූපී වාර්තා අතර ශේෂයන්හි එකතුව රු.640,095ක නොසැසඳුණු වෙනසක් පැවතුණි. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඇ) | කහතුඩුව හා කොස්ගම ගොවිජන බැංකු දෙකෙහි මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ ප්‍රගති සාරාංශය සහ අයවිය යුතු ණය හා ලැබිය යුතු ණය පොලී ශේෂයෙන් අතර පිළිවෙලින් රු.4,508,170ක හා රු.294,064ක නොසැසඳුනු වෙනසක් පැවතුණි. | පිළිගනිමි. | - එම - |

**1.3.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල ගොවිජන සේවා කාරක සභා 05ක ජ'නල් සටහන් 226ක් හා ගොවිජන බැංකු 03ක ජ'නල් සටහන් 44ක් පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව ජ'නල් වවුචර් පිළියෙල කර ගිණුම්ගත කර තිබුණු අතර හෝමාගම ගොවිජන බැංකුවේ පොදු ජ'නලය තුල සටහන් කළ යුතු ගණුදෙනු සඳහා ජ'නල් සටහන් තැබීමකින් තොරව ගිණුම්වල සටහන් කර තිබුණි. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කරන බව | උපකාරක ලේඛන සහිතව ජ'නල් වවුචර් සකස් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසු ජ'නල් සටහන් තැබිය යුතු අතර එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය |

**1.3.5 අවිනිශ්චිත ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාලඹේ ගොවිජන සේවා කාරක සභාවේ අවිනිශ්චිත ගිණුමේ වසර 33ක සිට පැවත එන රු.145,543ක බැර ශේෂයක් ද වසර 13ක සිට පැවත එන රු.222,621ක හර ශේෂයක් හා රු.115,297ක බැර ශේෂයක් ද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කර නොතිබුණි. තවද කොස්ගම ගොවිජන සේවා කාරක සභාවේ වසර 10ක සිට පැවත එන අවිනිශ්චිත ගිණුමේ රු.254,065ක හර ශේෂය සමාලෝචිත වර්ෂයේදී ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයේ අනුමැතියකින් තොරව සමුච්චිත අරමුදලට ගලපා තිබුණි. | ඉදිරියේදි සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කරන බව | අවිනිශ්චිත ගිණුම් ශේෂයන්ට අදාළ හේතු කඩිනමින් සොයාබලා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු අතර, අනුමැතියෙන් තොරව සිදුකළ ගැලපීම් සඳහා විධිමත් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.3.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 9ක රු.35,577,781ක මූල්‍ය නොවන වත්කම් පැවතුණද, එම ශේෂ සනාථ කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. . | ඉදිරි ගිණුම් වාර්තා සැකසීමේ දී අදාළ විස්තරාත්මක ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය නොවන වත්කම් ශේෂ තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2024 දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 06ක රු.4,897,832ක ණයහිමි ශේෂ පැවතියද එම ශේෂ සනාථ කරගැනීම සඳහා ශේෂ සනාථන කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ඉදිරි ගිණුම් වාර්තා සැකසීමේ දී අදාළ විස්තරාත්මක ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ණයහිමි ශේෂ තහවුරු කර ගැනීමට අදාළ ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කොස්ගම ගොවිජන සේවා කාරක සභාවේ රු.1,426,169ක දිගුකාලීන ණය ශේෂයේ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ඉදිරියේදී මෙම ශේෂ සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කරන බව. | දිගුකාලීන ණය ශේෂය තහවුරු කර ගැනීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ගොවිජන බැංකු 8ක එකතු වටිනාකම රු.53,063,960ක් වූ විවිධ තැන්පතු ශේෂවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ඉදිරි ගිණුම් වාර්තා සැකසීමේ දී අදාළ විස්තරාත්මක ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | විවිධ තැන්පතු ශේෂ නිරවද්‍යතාව පරීක්ෂාව සඳහා ශේෂ සනාථ කිරීමේ ලිපි හෝ වියිමත් ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | මාලඹේ ගොවිජන සේවා කාරක සභාව විසින් රෝද හතරේ ට්‍රැක්ටරය 2017 වර්ෂයේදී පාදුක්ක ගොවිජන සේවා කාරක සභාව වෙත ලබා දී තිබුණද ට්‍රැක්ටර් රථය ලබා ගැනීමට අදාළ කිසිදු ලිඛිත තොරතුරක් පාදුක්ක ගොවිජන සේවා කාරක සභාව විසින් විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර ට්‍රැක්ටර් රථයේ වටිනාකම ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ට්‍රැක්ටර් රථය පවරා ගැනීමට අදාළ ලේඛණ ඉදිරිපත් කිරීමටත්, ට්‍රැක්ටර් රථයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 53(4)(අ) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 08ක ඉඩම් ලේඛන වසර 03කට වරක් කොමසාරිස් ජනරාල් විසින් පරීක්ෂා කර සහතික කර නොතිබුණි. | ඉදිරියේදී ඉඩම් ලේඛන සහතික කර ගැනීමට කටයුතු කරන බව. | ගොවිජන සංවර්ධන පනත ප්‍රකාරව ඉඩම් ලේඛන පරීක්ෂා කර සහතික කිරීමට කටයුතු කළ යුතු අතර, අනුකූලව කටයුතු නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මු.රෙ. 134 (3) | කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 09හි සිදු කරනු ලැබූ අභ්‍යන්තර විගණන පරීක්ෂණවල විගණන වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී ගොවිජන අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත යොමු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තා පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | මු.රෙ.188 (2) | හෝමාගම ගොවිජන සේවා කාරක සභාවේ සහ පාදුක්ක ගොවිජන බැංකුවෙහි වසර 3 සිට වසර 14ක කාලසීමාව ඉක්ම වූ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ එකතු වටිනාකම රු.64,915ක් වූ චෙක්පත් 05ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර එසේ කටයුතු නොකළ නිළධාරීන්ට පියවර ගත යුතුය. |
| (iii) | මු.රෙ.396 | කොස්ගම හා හෝමාගම ගොවිජන සේවා කාරක සභා දෙකෙහි වසර 02 සිට වසර 10ක කාලසීමාව ඉක්මවා නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ එකතු | පිළිගනිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නිරවුල් කර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වටිනාකම රු.78,139ක චෙක්පත් 07ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | |
| (iv) | මු.රෙ. 757 (2) (අ) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළ ගොවිජන සේවා කාරක සභා 09හි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත යොමු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 4/2012 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 5.6(1) ඡේදය | ගොවිජන බැංකුවට අදාළ සියලුම ගිණුම් ගොවිජන සේවා කාරක සභාවේ වාර්ෂික අවසන් ගිණුම්වලට ඇතුළත් කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 09 විසින් එසේ කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | චක්‍රලේඛයේ 5.6(1) ඡේදයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 ජුනි 25 දිනැති අංක 8/2020 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 4 ඡේදය | කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 08ක භාණ්ඩ හා මුදල් භාරව කටයුතු කරන චෙක්පත් අත්සන් කරනු ලබන නිලධාරීන් විසින් චක්‍රලේඛය ප්‍රකාරව තැන්පත් කළ යුතු නියමිත ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. | ඉදිරියේදී නියමිත ඇප මුදල් තැන්පත් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව නියමිත ඇප මුදල් තැන්පත් කිරීමට කටයුතු කළ යුතු අතර එසේ නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2024 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 08ක රු.5,810,977ක අතිරික්තයක් ද, කොලොන්නාව ගොවිජන සේවා කාරක සභාවේ රු.84,363ක ඌණතාවයක් වූ අතර 2023 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 07ක රු.5,809,295ක අතිරික්තයක් ද, කහතුඩුව හා කොලොන්නාව ගොවිජන සේවා කාරක සභා දෙකෙහි එකතුව රු.784,397ක ඌණතාවයක් විය. සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵල අනුව ගොවිජන බැංකු 09 හි රු.5,672,325ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ගොවිජන බැංකු 09 හි රු.4,546,692ක අතිරික්තයක් විය.

### 2.2 මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණය

(අ) ගොවිජන සේවා කාරක සභා 07 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලවල එකතු වටිනාකම රු.5,600,723ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව එම කාරක සභා 07හි ඉකුත් වර්ෂයේ අතිරික්තයේ එකතු වටිනාකම රු.5,809,295ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයන් හි රු.208,572ක පසුබෑමක් නිරීක්ෂණය විය. මෙම පසුබෑමට කැස්බෑව ගොවිජන සේවා කාරක සභාව විසින් දිස්ත්‍රික් කාර්යාලයට කල පරිත්‍යාග හා කුඹුරු ඉඩම් වෙනත් කාර්යයකට යෙදවීමේ ඉල්ලුම් පත් ආදායම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ආ) කහතුඩුව ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.210,254ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.217,913ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.428,167ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට කුඹුරු ඉඩම් වෙනත් කාර්යයන්ට යෙදවීමේ ඉල්ලුම්පත් ආදායම වැඩිවීම හා කාමර කුලී ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ඇ) කොලොන්නාව ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.84,363ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.566,484ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.482,121ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට කුඹුරු ඉඩම් වෙනත් කාර්යයන්ට යෙදවීමේ ඉල්ලුම්පත් ආදායම හා කාමර කුලී ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ඈ) ගොවිජන බැංකු 09ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලවල එකතුව රු.5,672,325ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ එම බැංකුවල අතිරික්තයේ එකතු වටිනාකම රු.4,546,692ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.1,125,633ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඒ සඳහා බැංකු ණය පොලී ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ඉ) ගොවිජන සේවා කාරක සභාවන්හී මූලික කාර්යයභාර්යක් ලෙස පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය, බීජ සහ පැළ, කෘෂි උපකරණ ඇතුළු කෘෂිකාර්මික භාණ්ඩ අලෙවි කිරීම වන අතර සමාලෝචිත වර්ෂයට අදාළව ගොවිජන සේවා කාරක සභා 09හි මුළු අලෙවි ආදායම රු.29,056,551ක් වූ අතර ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේ දී ගොවිජන සේවා කාරක සභා 09හි මුළු අලෙවි ආදායම රු.29,300,673ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුළු අලෙවි ආදායම රු.244,122 කින් අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කැස්බෑව ගොවිජන සේවා කාරක සභාව සතු අලෙවිසැල් 11ට අදාළව එළඹී බදු ගිවිසුම්වල බදු කාලසීමාව 2020 සහ 2021 වර්ෂවල දී අවසන්වී තිබුණු අතර 2021 පෙබරවාරි මාසයේදී සියලුම අලෙවිසැල්වල බදු කුලිය ඉහළ දැමීමට තීරණය කළද එම බදු කුලියට එකඟ නොවීම හේතුවෙන් 2021 මාර්තු මාසයේ සිට බදු කුලිය ගෙවීම පැහැර හැර තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කුලී ආදායම රු.2,210,765ක් වූ අතර ඉන් රු.295,714ක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු කුලී ආදායම විය. මෙම අලෙවිසැල් බදුදීම සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනයකට අදාළව ක්‍රියාත්මක කළ යුතු නිර්දේශය වූයේ පවතින සියලු වෙළඳසැල් ගොවි සංවිධාන හා ව්‍යාපාරිකයින් සඳහා විවෘත තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගින් වැඩි මිල ගණන්වලට ලබා දිය යුතු බව වුවත් 2025 ජුනි වන විට වාර්තාව ලැබී වර්ෂ 2කට ආසන්න කාලයක් ගතවී තිබුණද අදාළ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | හිඟ මුදල් අලෙවිසැල් හිමියන් දැනුවත් කර අයකර ගැනීම හා මෙම අලෙවිසැල් අලුත්වැඩියා කර විවෘත ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේ ගැණුම්කරුවන්ට ලබා දීමට ඉදිරියේ දී කටයුතු කරන බව. | හිඟ මුදල් අයකර ගැනීමට හා ලබා දී ඇති නිර්දේශ පරිදි තරඟකාරී ප්‍රසම්පාදනය අනුව කටයුතු කරමින් කාරක සභාවේ ආදායම් ඉපයීම් වැඩිකර ගැනීම සඳහා කටයුතු කළ යුතු අතර එසේ කටයුතු නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය |
| (ආ) | කහතුඩුව ගොවිජන සේවා කාරක සභාවට අයත් 1989 වර්ෂයේ ත්‍රස්තවාදී උවදුරු කාලය තුල තාවකාලිකව පොලිස් ස්ථානයක් සඳහා ලබා දී තිබුණු ඉඩම සමාලෝචිත වර්ෂය අවසානයටත් ආපසු ලබා ගැනීමට නොහැකි වී තිබුණි. තවද ගොවිජන සේවා කාරක සභා 06ක් පිහිටුවා ඇති ඉඩම් සමාලෝචිත වර්ෂය අවසානයටත් කාරක සභා වෙත පවරා ගැනීමටද නොහැකි වී තිබුණි. | ඉල්ලීම් ඉදිරිපත් කර ඇතත් පවරා දී නොමැති බව. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි කාරක සභාවන්ට අයත් ඉඩම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | "ගොවි සෙවන" වැඩසටහන සඳහා පාදුක්ක ගොවිජන සේවා කාරක සභාවට පවරාදී තිබුණු පර්චස් 82 කින් යුතු "දඹෝර" ඉඩම ඵලදායී ආර්ථික කටයුත්තක යෙදවීමට කටයුතු කර නොතිබුණි. | දඹෝර ගොවි සංවිධානය විසින් ඉඩම නඩත්තු කරන අතර සේවා පියස ඉදිකර ඇත. | ඉඩම විධිමත් පරිදි ඵලදායී ආර්ථික කටයුත්තක යෙදවීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 09ට අදාළ ව 2024 වර්ෂයේ මහ කන්නයේ වී වගා කළ හැකි කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 12,888ක් වුවත් වගා කල කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 7,873ක් විය. ඒ අනුව වී වගා කල හැකි කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් අක්කර 5,015ක් වගා කර නොතිබුණි. | කම්කරු හිඟය, ගංවතුර බලපෑම් හා පූර්ණ කාලීන ගොවිතැනෙහි යෙදෙන ගොවීන් නොමැති වීම නිසා වගා කිරීමට මැලිකමක් දැක්වීම. | වී වගා කළ හැකි කුඹුරු ඉඩම් ප්‍රමාණය වී වගාව සඳහා යොදා ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 08 ක වර්ෂ ගණනාවක සිට පැවත එන එකතුව රු.4,572,104ක ලැබිය යුතු ශේෂයක් අය කර ගැනීමට හා කාරක සභා 07ක එකතුව රු.5,753,615ක ගෙවිය යුතු ශේෂයක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් කටයුතු කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් ලැබුණු පසු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂ කාලීනව අයකිරීමට කටයුතු නොකළ පාර්ශව වෙත පියවර ගැනීමත් ලැබිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට හෝ විධිමත් අනුමැතියක් ලබාගෙන කපා හැරීමට ද ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට හෝ විධිමත් අනුමැතියක් ලබාගෙන සමුච්චිත අරමුදලට ගැලපීමටද කටයුතු කළ යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවලට අනුව ගොවිජන සේවා කාරක සභා 04ක කුඹුරු ඉඩම් වෙනත් කාර්යයක් සඳහා යෙදවීමට අවසර ලබා දීම් සම්බන්ධයෙන් 2023 සහ 2024 වර්ෂයන්හිදී පර්චස් 2,313 කට අදාළව සියයට 60ක ආදායම ලෙස රු.5,004,272 ලබාගෙන තිබුණද මෙම කුඹුරු ඉඩම් ප්‍රමාණයන් සම්බන්ධයෙන් ඉඩම් නාම ලේඛනයේ ගැලපීම් සිදු කර නොතිබුණි. | මාලඹේ, කෝට්ටේ හා පාදුක්ක ගොවිජන සේවා කාරක සභා පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ලේඛණ යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතු අතර එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාලඹේ ගොවිජන සේවා කාරක සභාව විසින් නඩු පවරා තිබුණු අක්කරයක් වූ "දියපරගහ" කුඹුර සම්බන්ධයෙන් 2022 අප්‍රේල් 04 දින ස්ථිර තහනම් අඥාවක් යටතේ නඩුව අවසන් කර තිබුණි. ඉන්පසු නැවත නඩු පැවරීම සඳහා 2023 නොවැම්බර් 22 දින ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී විසින් කොළඹ දිස්ත්‍රික් කාර්යාලය වෙත නඩු ලේඛන ඉදිරිපත් කර තිබුණ ද 2025 ජුනි වන විටත් නැවත නඩු පැවරීම සඳහා අවශ්‍ය ලිපි ලේඛණ යොමු කර මාස 15කට අධික කාලයක් ගතවී තිබුණද නඩු පැවරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන පනතට අනුකූල නොවන ලෙස කටයුතු කිරීම සම්බන්ධයෙන් නොපමාව විධිමත් ක්‍රියාමාර්ග ගැනීමටත් අදාළ කාර්යය ප්‍රමාද කරන පාර්ශව වෙත පියවර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | මාලඹේ ගොවිජන සේවා කාරක සභාවට අදාළ රූඩ් 02ක "හිග්ගහ" කුඹුර අනවසරෙන් ගොඩ කිරීම සම්බන්ධයෙන් නඩු පවරා තහනම් අඥාවක් ස්ථිර කර තිබුණි. එයට එරෙහිව වග උත්තරකාර පාර්ශවය විසින් අභියාචනා අධිකරණයේ නඩු පවරා ලබාදුන් අතුරු තහනම් අඥාව අවලංගුකර නැවත නඩු පවරා තිබුණි. එම නඩුව කැඳවන ලද අවස්ථාවේදී ද වග උත්තරකරුගේ පාර්ශවය විසින් නඩුව අවසන් කර ගැනීම සඳහා ඉල්ලීමක් සිදු කර එම ඉල්ලීමට අනුව දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් විසින් 2023 දෙසැම්බර් මස විෂයගත කුඹුරු ඉඩමේ පර්චස් එකක් සඳහා රු.20,000 බැගින් මුදලක් කාරක සභාව වෙත අයකර නඩුව සමථයකට පත්කර ගැනීමට එකඟත්වය පලකර තිබුණි. ඒ අනුව වගඋත්තරකරු විසින් ගොඩ ඉඩම් සහතික ලබා ගැනීමට 2023 දී පර්චස් 80ක් සඳහා රු.1,600,000ක්ද ගෙවා තිබූ අතර වගඋත්තරකරුගේ ඉල්ලීම මත එම ඉඩමේ ඉතිරි පර්චස් 20.2ක භූමි ප්‍රමාණය සඳහා රු.404,000ක් ගෙවා ගොඩ ඉඩම් සහතික ලබාගැනීමට ගොවිජන සංවර්ධන කොමසාරිස් විසින් අවසර දී තිබුණි. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත කුඹුරු ඉඩම් වෙනත් කාර්යයන්හි යෙදවීමට අවසර දීම සම්බන්ධයෙන් කෘෂිකර්ම පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ගොවිජන සංවර්ධන පනතට අනුකූල නොවන ලෙස කටයුතු කිරීම මත ආරම්භ කරන නඩු කටයුතු පසුව දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් විසින් ඉදිරියට රැගෙන යාමකින් තොරව වන්දි මුදල් ලබා ගැනීමට කටයුතු කිරීම වැරදි පූර්වාදර්ශයක් නොවීමට අවශ්‍ය විධිවිධාන යෙදීමට කටයුතු කිරීමත්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ උපදෙස් ලිපිය ප්‍රකාරව කුඹුරු ඉඩම් වෙනත් කාර්යයන්හි යෙදවීමට අවසර දීම සම්බන්ධයෙන් කටයුතු කිරීම හා එම උපදෙස් කඩකිරීම් |

| | | |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් නිකුත් කර තිබූ 2005 මැයි 13 දිනැති අංක 04/08/9 දරන ලිපිය ප්‍රකාරව කුඹුරු ඉඩමක් ගොඩකිරීමට අපේක්ෂා කරන ඉල්ලුම්කරුවකු විසින් අනුගමනය කළ යුතු කාර්යපටිපාටියට අනුකූලව ඉහත හිග්ගහකුඹුර ඉඩම වෙනත් කාර්යයන්හි යෙදවීමට අනුමැතිය ලබා දී තිබේ ද යන්න තහවුරු කර ගැනීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර මෙසේ අනුමැතිය ලබා දීමේදී යායක් මැද පිහිටි කුඹුරු ඉඩමක්, ඇලක මායිම් වන්නට පිහිටි කුඹුරු ඉඩමක්, තුන් පැත්තකින් කුඹුරුවලින් වටවූ කුඹුරු ඉඩමක්, වගා කළ හැකි කුඹුරු ඉඩම් සඳහා අවසර ලබා නොදිය යුතු බව සඳහන් වුවත් මෙසේ අවසර ලබාදී තිබෙන උක්ත සඳහන් කුඹුරු ඉඩම දැනට වගා කටයුතු සිදුකරනු ලබන කුඹුරු යායක මධ්‍යයයේ ඇල මාර්ගයකට මායින්ව පිහිටා තිබූ අතර ඒ අනුව අදාල නියමයන්ට පටහැනිව කටයුතු කර තිබියදි වගඋත්තරකරු විසින් අධිකරණයෙන් ඉල්ලා තිබූ ඉල්ලීම සලකා බලා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් ඉදිරි නඩුව සමථයකට පත්කර විෂයගත කුඹුරු ඉඩම් වෙනත් කාර්යයන් සඳහා යෙදවීමට අවසර ලබා දී තිබීම මතභේදාත්මක විය. | | පිළිබඳව වගකිව යුතු නිළධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමත් කළ යුතුය. |

### 3.4 මූල්‍ය කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| හෝමාගම ගොවිජන සේවා කාරක සභාවේ පවතින ජංගම බැංකු ගිණුම් 02ක් අක්‍රීය තත්වයේ පැවති අතර එම ගිණුම්වල 2024 දෙසැම්බර් 31 දිනට රු.74,860ක ශේෂයක් පැවතුණි. | පිළිගනිමි. | අක්‍රීය බැංකු ගිණුම් තවදුරටත් පවත්වාගෙන යාමට අවශ්‍යතාවයක් නොමැති නම් එම ගිණුම් විධිමත් අනුමැතියක් මත අවසන් කිරීමට කටයුතු කිරීම. |

### 3.5 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අභ්‍යන්තර විගණන වාර්තා මගින් හඳුනාගෙන තිබුණු කොස්ගම හා කෝට්ටේ ගොවිජන බැංකු දෙකෙහි සිදු වූ රු.1,048,405ක මූල්‍ය වංචාවන්ගෙන් කොස්ගම ගොවිජන බැංකුවට අදාළව රු.300,000ක් 2025 ජූලි වන විට අය වී තිබුණි. මෙම මූල්‍ය වංචා අනාවරණය වී වසර 08ත් වසර 20කට වඩා වැඩි කාලයක් ගතව ඇතත් නිලධාරීන්ට එරෙහිව මුදල් රෙගුලාසි 104 හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 29.4 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු සිදු කර නොතිබුණි. | පිළිගනිමි. අදාළ ගැලපීම් සඳහා ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වෙතින් උපදෙස් ඉල්ලා එම උපදෙස් ලැබුණු පසු ගැලපීම් සිදු කරන බව. | මූල්‍ය වංචා සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | කෝට්ටේ ගොවිජන සේවා කාරක සභාවේ 2008 හා 2014 වර්ෂ වල අභ්‍යන්තර විගණන වාර්තා මගින් අනාවරණය වී තිබූ රු.764,838ක තොග ඌණතාවයෙන් රු.683,215ක් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකරගෙන නොතිබුණි. | වගකිව යුතු පාර්ශව අනාවරණය වී නොමැති බැවින් ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව උපදෙස් ඉල්ලා ඇති බව. | මූල්‍ය වංචා සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | මාලඹේ ගොවිජන සේවා කාරක සභාවේ 2024 වර්ෂයේ රු.224,363ක තොග කපාහැරීම් සඳහා දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් විසින් තොග ප්‍රමාණයන් හා ඊට අදාළ වටිනාකම් දැක්වීමකින් තොරව අනුමැතිය ලබා දී තිබුණි. උක්ත තොග කපාහැරීම් වලට අදාළව විගණනයට ඉදිරිපත් කළ විස්තරාත්මක වාර්තාවෙහි රු.213,174ක තොග කපා හැර ඇති බව දක්වා තිබුණද මූල්‍ය ප්‍රකාශනවල කපාහැර ඇති තොගයේ වටිනාකම රු.224,363ක් වුයෙන් රු.11,189ක වෙනසක් පැවතුණි. තවද උක්ත තොග කපාහැරීම තුල ඇතුළත් ව ඇති රු.42,525ක වටිනාකමකින් යුත් විනාශ වු බීජ පැකට් 1,575ක් 2012 වර්ෂයට පෙර මිල දී ගත් තොග ලෙස දක්වා තිබුණ ද, එම තොග 2012 වර්ෂයට පෙර මිලදී ගත් තොග නොවන බව විගණනයේදී අනාවරණය විය. . | 2012 වර්ෂයේ තොග පොත් පරීක්ෂා කර ඊට පෙර පැවති කල් ඉකුත් වූ තොග හා 2012 සිට 2023 වර්ෂය දක්වා විනාශ වී ගිය තොග පරීක්ෂා කර බලා 2024 කමිටුව මගින් කපා හැර ඇත. | තොග කපා හැරීම් වලදී විධිමත් පටිපාටි වලට අනුව නිශ්චිතව තොග ප්‍රමාණය හා වටිනාකම් හඳුනාගෙන කපා හැරීමට කටයුතු කළ යුතුය. අවිධිමත්ව කටයුතු කළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

**3.6 වත්කම් කළමනාකරණය**

**3.6.1 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 05ක ට්‍රැක්ටර් රථ 12 ක් හා ටේලර් 04ක් භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි. | පිළිගනිමි. ඉදිරියේ දී අලුත්වැඩියා කල හැකි නම් ඵලදායීව යොදාගැනීමට කටයුතු කරන බව. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ වත්කම් භාවිතා කිරීමට නොහැකි තත්ත්වයේ පවතී නම් විධිමත් අනුමැතිය යටතේ අපහරණයට හෝ කටයුතු කළ යුතුය. |
| (ආ) | පාදුක්ක ගොවිජන සේවා කාරක සභාවේ ගබඩාව තුල 2020 හා 2023 වර්ෂයේ සහනාධාර ලෙස ලැබී තිබූ යූරියා පොහොර කිලෝ 2,465ක් , M.O.P පොහොර කිලෝ 5,789ක් හා E.R.P පොහොර කිලෝ 800ක් පැවති අතර මෙම E.R.P පොහොර තොගය පොත් වලට ද ඇතුළත් කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | සියලුම තොග පොත්වලට ඇතුළත් කිරීමටත් කල් ඉකුත්වීමට පෙර තොග සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන බැංකු 09ක් විසින් පරිගණක උපාංග මිලදී ගැනීම සඳහා එකතු වටිනාකම රු1,767,085ක මුදලක් දිස්ත්‍රික් කාර්යාලය වෙත 2023 වර්ෂයේ දී ගෙවීම් කර තිබූ අතර, 2024 වර්ෂයේ දී මෙම පරිගණක මුද්‍රණ යන්ත්‍ර හා උපාංග කාරක සභාව වෙත ලැබී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානයටත් එම උපකරණ භාවිතා කිරීම සඳහා පරිගණක මෘදුකාංග වැඩසටහන හඳුන්වා දී නොතිබීම හේතුවෙන් මෙම උපකරණ නිෂ්ක්‍රීයව පැවතුණි. | ඉදිරියේ දී දෙපාර්තමේන්තු උපදෙස් මත කටයුතු කරන බව. | මෙම වැඩසටහන හඳුන්වා දීමට පවතින ගැටලු නිරාකරණය කර ගනිමින් අදාළ වත්කම් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.7 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් කාර්යාලයට හා ගොවිජන සේවා කාරක සභා 09ට අදාළ අනුමත කාර්ය මණ්ඩලය 433ක් ද තත්‍ය කාර්ය මණ්ඩලය 365ක් ද වුයෙන් තනතුරුවල පුරප්පාඩු 77ක් හා අතිරික්ත 09ක් පැවතුණි. ඉන් ගොවිජන සේවා කාරක සභා | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | කාර්යමණ්ඩළ සමාලෝචනයක් සිදු කර අත්‍යාවශ්‍ය පුරප්පාඩු පමණක් පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 09යෙහි කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන වසම් 312ක් පවතින අතර, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් 53ක පුරප්පාඩු පැවති අතර ගොවිජන සේවා කාරක සභා 09 යෙහිම ගොවි බැංකු නිලධාරී සහ ගොවි බැංකු සහයක තනතුර බැගින් පුරප්පාඩුව පැවතුණි. | | |
| (ආ) | කෝට්ටේ සහ කොලොන්නාව ගොවිජන සේවා කාරක සභා 02ට අදාළ ව කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන වසම් 38ක් පැවතිය ද එම ගොවිජන සේවා කාරක සභා 2හි වී වගා කළ හැකි කුඹුරු ඉඩම් වසම් 09ක පමණක් විය. තවද 2023 නොවැම්බර් 23 දිනැති අංක 2359/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව කෝට්ටේ ගොවිජන සේවා කාරක සභාවට අයිතිව පැවති කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන වසම් 21, වසම් 05ක් දක්වා සංශෝධනය කර තිබුණද කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් 15ක් මෙම වසම් 05ට අදාලව අනුයුක්තව සේවයේ යොදවා තිබුණි. | නිලධාරීන් ගෙවතු හා “සිතමු” කාන්තා වැඩසටහනට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි. ඉතිරි නිලධාරීන් වෙනත් ගොවිජන සේවා කාරක සභා වලට අනුයුක්ත කිරීමට සුදුසු වැඩපිළිවෙලක් සකස්කරන බව. | වසමක් තුළ ක්‍රියාත්මක කුඹුරු ඉඩම් හා අනෙකුත් වගා කටයුතු අනුව අවශ්‍ය කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකරුවන් සංඛ්‍යාව තීරණය කර අනුයුක්ත කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගොවිජන බැංකු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන බැංකු හතරක ණයකරුවන් 34ක් වෙත ලබා දී තිබූ විවිධ ණය සහ ඊට අදාළ පොලිය සමග රු. 927,889ක් වර්ෂ 2ත් වර්ෂ 23 අතර කාලයක සිට ලැබිය යුතුව පැවතිද එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය අතරින් බොහෝ ණය ශේෂ සම්බන්ධයෙන් මේ වන විට ගොවිජන විනිශ්චය සභාවේ නඩු විභාග වෙමින් පවතින බව. | කාලීනව ණය අය නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමත් ණය අයකර ගැනීම සඳහා අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමත් කළ යුතුය. |